**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**මහාමාර්ග අමාත්‍යාංශය**
**මාර්ග සංවර්ධන අධිකාරිය**
**ලංසු කැඳවීම.**

මාර්ග සංවර්ධන අධිකාරියේ වයඹ පළාත් අධ්‍යක්ෂගේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත දැක්වෙන කොන්ත්‍රාත්තු සඳහා යෝග්‍යතා පූර්ණ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගේ මුද්‍රා තබන ලද ලංසු සඳහා ආරාධනා කෙරේ.

| කොන්ත්‍රාත් අංකය | ව්‍යාපෘතියේ නම | අවශ්‍ය ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | ලංසු ආරක්ෂණය (රු.) | ආපසු නොගෙවනු ලබන ගාස්තුව (VAT රහිත) | සැපයීම් කාලය |
|---|---|---|---|---|---|
| **RDA/SP/1500 KM/NWP/DL /12** | කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් යාපහුව සහල් මෝල අසල සිට කරුවලගහවත්ත හරහා මොරගොල්ල මාර්ගයේ කි.මී. 0+000 - කි.මී. 1+700 කොටස සඳහා පෙරමුසු (ASPHALT WEARING COURSE) සපයා දීම. | **645** | **199,900.00** | **4,250.00** | මාස 01 |
| **RDA/SP/1500 KM/NWP/DL /13** | කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් යාපහුව සහල් මෝල අසල සිට කරුවලගහවත්ත හරහා මොරගොල්ල මාර්ගයේ කි.මී. 1+700 - කි.මී. 3+000 කොටස සඳහා පෙරමුසු (ASPHALT WEARING COURSE ) සපයා දීම. | **455** | **141,000.00** | **3,350.00** | මාස 01 |
| **RDA/SP/1500 KM/NWP/DL /14** | කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් වරාවැව හෙට්ටිආරච්චිගම (අදියර 2) මාර්ගයේ කි.මී. 0+000– කි.මී. 1+500 කොටස සඳහා පෙරමුසු (ASPHALT WEARING COURSE ) සපයා දීම. | **485** | **159,200.00** | **3,650.00** | මාස 01 |
| **RDA/SP/1500 KM/NWP/DL /15** | පුත්තලම දිස්ත්‍රික්කයට අයත් හාල්දඬුවන පාසැල් මාවතේ කි.මී. 0+000 - කි.මී. 1+000 කොටස සඳහා පෙරමුසු (ASPHALT WEARING COURSE ) සපයා දීම. | **427** | **138,150.00** | **3,250.00** | මාස 01 |
| **RDA/SP/1500 KM/NWP/DL /16** | පුත්තලම දිස්ත්‍රික්කයට අයත් ධර්මපාලයාය වැව මාර්ගය සඳහා පෙරමුසු (ASPHALT WEARING COURSE ) සපයා දීම. | **275** | **101,950.00** | **2,500.00** | මාස 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **RDA/SP/1500 KM/NWP/DL /17** | **පුත්තලම දිස්ත්‍රික්කයට අයත් පුලියන්කුලම පිරවුම්හල අසලින් විහාරස්ථානය දක්වා මාර්ගය (අදියර 1 ) සඳහා පෙරමුසු (ASPHALT WEARING COURSE ) සපයා දීම.** | **571** | **197,700.00** | **4,250.00** | **මාස 01** |
| **RDA/SP/1500 KM/NWP/DL /18** | **පුත්තලම දිස්ත්‍රික්කයට අයත් පුලියන්කුලම පිරවුම්හල අසලින් විහාරස්ථානය දක්වා මාර්ගය (අදියර 2 ) සඳහා පෙරමුසු (ASPHALT WEARING COURSE ) සපයා දීම.** | **571** | **197,700.00** | **4,250.00** | **මාස 01** |

1. ලංසු කැඳවීම **ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටියට** අනුව සිදුකරනු ලැබේ. වයඹ පළාත තුළ ලියාපදිංචි ලංසුකරුවන්ගේ ලංසුව සඳහා **5%**ක ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලැබේ.

2. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය(වයඹ), මාර්ග සංවර්ධන අධිකාරිය ,පුත්තලම් පාර, කුරුණෑගල වෙතින් වැඩි තොරතුරු ලබා ගත හැක
**දුරකථන අංකය . 037 - 2056534**

3. **2024.05.03** දින **පෙ.ව.10.00** ට මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත්භාර අධ්‍යක්ෂ (වයඹ) කාර්යාලයේ දී පූර්ව ලංසු රැස්වීම පැවැත්වෙන අතර ක්ෂේත්‍ර පරීක්ෂාවද එදිනම සිදු කෙරේ.

4. **1987 අංක 3 දරණ පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත යටතේ සෑම කොන්ත්‍රාත්තුවක් සඳහා ( කොන්ත්‍රාත් අගය මිලියන 5 ට වැඩි) වෙන වෙනම ලියාපදිංචි වී තිබීම අනිවාර්ය වේ.**

5. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් **2024.04.26** දින සිට **2024.05.09** දින දක්වා **9.00** පැයේ සිට **15.00** පැය දක්වා **(සතියේ දින පමණි)** කාලය තුල ආපසු නොගෙවනු ලබන (ඉහත වගුවේ සඳහන්) ගාස්තුවක් සහිත (**VAT** රහිත) ලිඛිත අයදුම්පතක් සමග **සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සහතිකය හා CIDA** පොත පළාත්භාර අධ්‍යක්ෂ (වයඹ) , මාර්ග සංවර්ධන අධිකාරිය, පුත්තලම් පාර, කුරුණෑගල වෙත ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත සම්පූර්ණ ලංසු අයදුම්පත් කට්ටලයක් ලබා ගත හැකිය.

6. සම්පූර්ණ කරන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව ලියුම් කවරයේ වම් පස උඩ කෙලවරෙහි අදාල කොන්ත්‍රාත්තුව සඳහන් කර **2024.05.10** දින **14.00** පැයට හෝ ඊට පෙර **සභාපති, වයඹ පළාත් ප්‍රසම්පාදන කමිටුව, මාර්ග සංවර්ධන අධිකාරිය, කුරුණෑගල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුවේ. ප්‍රමාද වන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. ලංසු භාරගෙන අවසන් වූ වහාම එම ලංසු ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ විවෘත කරනු ලැබේ.

8. **2024.08.09** දින දක්වා ලංසුව වලංගුවේ.

9. ටෙන්ඩර් පත් සමග ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් සුරක්ෂිත කිරීමේ සහතිකය **2024.09.06** දින දක්වා වලංගු විය යුතුය.

10. මෙම ප්‍රසම්පාදනයේ අවසන් තීරණය ටෙන්ඩර් මණ්ඩලය සතුවේ.

**සභාපති ,**
වයඹ පළාත් ප්‍රසම්පාදන කමිටුව ,
පළාත් භාර අධ්‍යක්ෂ කාර්යාලය,
මාර්ග සංවර්ධන අධිකාරිය,
කුරුණෑගල.